# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගෲශාලාව

# ඇබෑර්තු

## විදුලි කාර්මික තනතුර (කොන්ත්‍රාත් පදනම)

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්** : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්** : තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ4) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** :
I. රු. 34,815-10X365-38,465
II. ඉහත සඳහන් වැටුපට අමතරව සියලු අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි** : කොන්ත්‍රාත් පදනම මත සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදලේ හිමිකම් ඇත.

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරනු ලබන ආයතන ප්‍රධානීන් මගින් ඍජුවම පිටපතක් යොමු කරමින් එවිය යුතුය. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

තනතුරට පත් කර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ පාලක මණ්ඩලය සතු වේ. අයදුම් කරන තනතුර කවරයේ ඉහළ වම්පස කෙළවරේ සටහන් කළ යුතුය. අයදුම්කරුවන් විසින් තමන්ගේ සම්පූර්ණ ජීව දත්තයන් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සමග 2021-04-27 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් අය වෙත යොමු කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**